

**හෙන්රි බී. අයිරින්**
**සභාපතිවරයා විසිනි**
පළවෙනි සභාපතිත්වයේ
පළවෙනි උපදේශකවරයා

# සුභාරංචිය හදවතෙන් හදවතට බෙදාගැනීම

සුභාරංචිය බෙදාගැනීමට සූදානම්ව සිටින දෙවියන්වහන්සේගේ සේවකයන්ගේ මාර්ගයේ එය ඇසීමට සූදානම්වූ ජනතාව උන්වහන්සේ තබනසේක. ඔබගේම ජීවිතයේ එය ඔබට සිදුව ඇත. එය සිදුවීමේ වාරගණන රඳාපවතින්නේ ඔබගේ මනසේ සහ හදවතේ සූදානම්වීම මතය.

මගේ මිතුරෙක් සුභාරංචිය ලබාගැනීමට සූදානම්ව සිටින යම් කිසිවෙකු හමුවීමට දිනපතාම යාච්ඤාකරයි. ඔහු මෝර්මන්ගේ පොතක් ඔහු සමග රැගෙන යයි. යම් කෙටි ගමනක් යාමට පෙර රාත්‍රියේ, මෝර්මන්ගේ පොතේ පිටපතක් රැගෙන නොයාමටත්, නමුත් ඒ වෙනුවට දීමට කාඩ්පතක් ගෙනයාමටත් ඔහු තීරණය කළේය. නමුත් ඔහු පිටත්වීමට සූදානම්වූ විට, ආත්මික පෙළඹවීමක් ඔහුට ලැබිනː "ඔබ සමග මෝර්මන්ගේ පොතක් රැගෙනයන්න." ඔහු පොතක් ඔහුගේ බෑගයේ දමාගත්තේය.

ඔහු හඳුනන කාන්තාවක් ගමනේදී ඔහුගේ ආසනය ළඟ හිඳගත් විට, ඔහු කල්පනා කළේය, "මෙයාද ඒ තැනැත්තී?" ගමන ගොස් නැවත එන විටදීද ඇය ඔහු සමගම ගමන්ගත්තාය. ඔහු මෙසේ සිතුවේය, "මා කෙලෙස සුභාරංචිය දිය යුතුද?"

ඒ වෙනුවට ඇය ඔහුට මෙසේ කීවාය, "ඔබ දසයෙන් කොටස ඔබගේ සභාවට ගෙවනවා, එහෙම නේද?" එසේ කරන බව ඔහු කීවේය. ඇය සිය සභාවට දසයෙන් කොටස ගෙවියයුතු නමුත්, එසේ නොකළ බව කීවාය. ඉන්පසුව ඇය මෙසේ ඇසුවාය, "මෝර්මන්ගේ පොත ගැන මට කීමට ඔබට තිබෙන්නේ මොනවාද?"

එය ශුද්ධ ලියවිලි පොතක් බවත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ තවත් සාක්ෂියක් වන එය, ජෝසෆ් ස්මිත් අනාගතවක්තෘවරයා විසින් පරිවර්තනයකළ බවත් ඔහු පැහැදිළි කළේය. ඇය තුළ කැමැත්තක් පෙනුන නිසා, ඔහු බෑගයට අත දමා මෙසේ කීවේය, "මේ පොත ගෙන ඒමට මට පෙළඹවීමක් ඇතිවුනා, මා සිතන්නේ ඒ ඔබ සඳහා බවයි."

ඇය එය කියවීමට පටන් ගත්තාය, ඔවුන් වෙන්වන විට, ඇය මෙසේ කීවාය. "මේ ගැන මා ඔබ සමග වැඩිදුර සංවාදයක් පවත්වනවා."

මගේ මිතුරා දැන නොසිටි—නමුත් දෙවියන්වහන්සේ දැන සිටි දෙය නම්—ඇය සභාවක් සොයමින් සිටි බවය. මගේ මිතුරා දෙස පරීක්ෂාවෙන් සිටි ඇය, ඔහුගේ සභාව ඔහුව මෙතරම් සතුටින් තබන්නේ කෙසේද යයි කල්පනා කළ බවත් දෙවියන්වහන්සේ දැන සිටිසේක. ඇය මෝර්මන්ගේ පොත ගැන අසන බව සහ ධර්මදූතයන්ගෙන් ඉගෙනගැනීමට ඇය කැමැත්තෙන් පසුවූ බවත් දෙවියන්වහන්සේ දැනසිටිසේක. ඇය සූදානම්වීම සිට ඇත. මගේ මිතුරාත් එසේමය. ඔබට සහ මටත් සූදානම්වීමට හැකිය.

අපට අවශ්‍යවන සූදානම්වීම නම් අපගේ මනසේ සහ හදවතේ සූදානම්වීමයි. එම කාන්තාව මෝර්මන්ගේ පොත, ස්වාමීන්වහන්සේගේ නැවත පිහිටුවූ සභාව, දෙවියන්වහන්සේට දසයෙන් කොටස ගෙවීමේ පණත ගැන අසා එම වචන මතකයේ තබාගෙන ඇත. එසේම ඇයගේ හදවතේ සත්‍යයේ සාක්ෂිය ආරම්භවීම ඇයට දැනී ඇත.

ශුද්ධාත්මයාණන් මගින් අපගේ මනසට සහ හදවතට සත්‍යය හෙළිකරන බව ස්වාමීන්වහන්සේ පවසා ඇතිසේක (බලන්න ඩීසහගී 8:2). ඔබට හමුවන බොහෝ දෙනෙක් සූදානම්වීම ආරම්භකර ඇත. දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ වචනය ඔවුහු අසා හෝ කියවා ඇත. ඔවුන්ගේ හදවත් ප්‍රමාණවත්ව මෘදුවී තිබේ නම්, සත්‍යය ස්ථිරකිරීම ඔවුන්ට කෙසේවුවද, යාන්තමින් හෝ හැඟී ඇත.

එම කාන්තාව සූදානම්ව සිට ඇත. මෝර්මන්ගේ පොත අධ්‍යයනයකළ පසු-දවස්වල ශුද්ධවන්ත, මගේ මිතුරාද එසේය. ඔහුට හැඟී ඇති සාක්ෂිය සත්‍ය එකකි. ඔහු සමග පිටපතක් ගෙනයාමට ආත්මයාණන්ගෙන් ලැබුන මග-පෙන්වීම ඔහු හඳුනාගත්තේය. ඔහු මනසින් සහ හදවතින් සූදානම්ව සිට ඇත.

නැවත පිහිටුවූ සභාව ගැන ඔබගේ සාක්ෂිය ලබාගැනීමට දෙවියන්වහන්සේ ජනතාව සූදානම්කරනසේක. ඔබට සහ ඔබ ප්‍රේමකරන අයට එතරම් වටිනාකමක් ඇති දෙයක් නිර්භීතව බෙදාගැනීමට ඔබගේ ඇදහිල්ල සහ ඉන්පසුව ඔබ ක්‍රියාත්මකවීම උන්වහන්සේට අවශ්‍යවේ.

ඔබගේ මනස දිනපතාම සුභාරංචි සත්‍යයන් වලින් පුරවාගෙන බෙදාගැනීමට සූදානම්වන්න. ඔබ පණත් ආරක්ෂාකරමින් ඔබගේ ගිවිසුම් තබනවිට, ආත්මයාණන්ගේ සාක්ෂිය සහ ගැලවුම්කරුවාණන් ඔබට සහ ඔබ හමුවන අයට දක්වන ප්‍රේමය ඔබට හැඟෙනු ඇත.

ඔබ ඔබගේ කොටස කරන්නේ නම්, හදවතින් හදවතට, ඔබගෙන් අන් අයට පිරිනමන ලද—ඔබගේ සත්‍යයේ සාක්ෂිය ඇසීමට සූනම්ව සිටින ජනතාව හමුවීමේ මිහිරි අත්දැකීම ඔබට වැඩියෙන් ලැබෙනු ඇත.

### මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

පවුල සමග පණිවුඩය කියවා යමෙකුගේ සාක්ෂිය ශක්තිමත්කිරීමට සභාපති අයිරින් සාකච්ඡාකරන මාර්ග සඳහන් අන්තිම වගන්තියට පෙර කොටස ඔවුන් සමග සාකච්ඡාකරන්න. සුභාරංචිය බෙදාගන්නා විට සාක්ෂිය දැරීමේ වැදගත්කම ගැන පවුල සමග සාකච්ඡාකරන්න. මිතුරන්ට සාක්ෂිය දරන අත්දම පවුලේ ළමයින් රංගනය කර පෙන්වීම උපකාරවත්විය හැකිය.

## තරුණඅය

### කිව යුතු දෙය දැනසිටීම

අන් අය සමග බෙදාගැනීමට ප්‍රමාණවත් ලෙස සුභාරංචි දැනුමක් ඔබට තැබි බව ඔබට හැඟේ නම්, මෙම ශුද්ධ ලියවිලි පොරොන්දු වලින් සැනසීමක් ලබාගන්න:

අපගේ හඬ මෙම ජනතාවට ඔසවා; ස්වාමීන්වහන්සේ අපගේ හදවතේ තබන සිතිවිලි කථාකිරීමෙන් මිනිසුන් ඉදිරියේ අප ව්‍යාකූල නොවනු ඇත;

මක්නිසාද නිසි පැයේදී එය එසේය, නිසි මොහොතේ, අප කිවයුතු දෙය, අපට දෙනු ඇත (බලන්න ඩීසහගී 100:5–6).

"නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියනලද සියල්ල නුඹලාට සිහිකරවනසේක" (යොහාන් 14:26).

මේවා ශ්‍රේෂ්ඨ පොරොන්දුය, නමුත් ඒවා ලබාගැනීම සඳහා, අප අපගේ කොටස කළ යුතුය. මෙම පණිවුඩය තුලින්, සභාපති අයිරින් එය කරන අත්දම අපට ඉගැන්වීය: "ඔබගේ මනස දිනපතාම සුභාරංචි සත්‍යයන් වලින් පුරවාගෙන [සුභාරංචිය] බෙදාගැනීමට සූදානම්වන්න." සුභාරංචි සත්‍යයන්වලින් ඔබගේ මනස පුරවාගැනීමට ඔබට කළ හැකි දේවල් මොනවාද?

## ළමයින්

### බෙදාගැනීමට සූදානම්වන්න

සුභාරංචිය බෙදාගැනීමට සූදානම්වීමේ වැදගත් ක්‍රමයක් වන්නේ, අපගේ මනස සුභාරංචි සත්‍යයන්ගෙන් පුරවාගැනීම බව සභාපති අයිරින් කියයි. බෙදාගැනීමට සූදානම්වීමට ඔබට කළ හැකි යම් දේවල් මොනවාද?

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/11. පරිවර්තන අනුමැතිය: 6/11.
*First Presidency Message, September 2012* පරිවර්තනයයි. Sinhala. 10369 408

# විශේෂිත අවශ්‍යතා සහ ලබාදුන් සේවාවන්

*මෙම ලිපිය යාච්ඤාවෙන් අධ්‍යයනයකර, අදාල පරිදි, ඔබ බැහැදකින සොහොයුරියන් හා එය බෙදාගන්න. ඔබගේ සොහොයුරියන් ශක්තිමත්කිරීමට සහ සහන සමිතිය ඔබගේ ජීවිතයේ ක්‍රියාකාරී කොටසක් කරගැනීමට උපකාරවත්වන ප්‍රශ්න අසන්න.*

**ඇදහිල්ල, පවුල, සහනය**

"අන් අයගේ අවශ්‍යතාවන් සැමදා පවතී," යයි තෝමස් එස්. මොන්සන් සභාපතිවරයා කීවේය, "තවද අප හැම කෙනෙකුටම යමකුට උපකාර කිරීමට යමක් කළ හැකිය. . . . අන් අයට සේවයකිරීම අපට නැතිවුනොත් හැර, අපගේම ජීවිතවල ඇත්තේ මඳ අරමුණකි."[1]

බැහැදැක උගන්වන ගුරුවරියන් ලෙස, අප බැහැදකින හැම සොහොයුරියක්ම හඳුනාගෙන අවංකවම ප්‍රේමකිරීමට අපට හැකිය. අප බැහැදකින අයට අප දක්වන ප්‍රේමය නිසා ඔවුන්ට සේවයකිරීමට ස්වභාවිකවම අපට හැකිවන්නේය. (බලන්න යොහාන් 13:34–35).

අපගේ සොහොයුරියන්ගේ ආත්මික සහ ලෞකික අවශ්‍යතාවයන් හඳුනාගෙන, අවශ්‍යවිට ඔවුන්ට සේවය කිරීමට අපට හැකිවන්නේ කෙසේද? බැහැදැක උගන්වන ගුරුවරියන් ලෙස, අප බැහැදකින අය ගැන යාච්ඤාකර දේව අනුග්‍රහය ලබාගැනීමට අපට හිමිකමක් ඇත.

අපගේ සොහොයුරියන් හා ක්‍රමානුකූල සම්බන්ධතාවයක් පවත්වාගැනීමද වැදගත්වේ. පුද්ගලික බැහැදැකීම්, දුරකථන ඇමතුම්, දිරිගැන්වීමේ සටහන්, ඊ-මේල් පණිවුඩ, ඇය හා එකට හිඳ පිළිසඳර පැවැත්වීම, අවංක සුභපැතුම්, සභාවේදී ඇය හමුවීම, රෝගීවූවිට හෝ අවශ්‍යවිටදී ඇයට උපකාරකිරීම, සහ වෙනත් සේවා ක්‍රියා එකිනෙකා ගැන සොයා බලා ශකතිමත්කිරීමට අපට උපකාරවත්වේ.[2]

බැහැදැක උගන්වන ගුරුවරියන්ගෙන් ඉල්ලා ඇත්තේ, සොහොයුරියන්ගේ ශරීර සනීපය, යම් විශේෂිත අවශ්‍යතා, සහ ඔවුන්ට ලබාදුන් සේවාවන් ගැන වාර්තාකිරීමටය. මේ අන්දමේ වාර්තා සහ සොහොයුරියන්ට අප ලබාදෙන සේවාවන්, අපගේ ගෝලකම ප්‍රදර්ශනයකිරීමට අපට උපකාරවත්වේ.[3]

### *ශුද්ධ ලියවිලිවලින්*

යොහාන් 10:14–16; 3 නෙපී 17:7, 9; මොරෝනි 6:3–4

### *අපගේ ඉතිහාසයෙන්*

එකිනෙකාට සේවයකිරීම නිතරම බැහැදැක ඉගැන්වීමේ හදවත වැනිය. එම සේවාව තුලින් අප දක්වන කරුණාව සහ මිත්‍රත්වය, මාසික බැහැදැකීම් අභිබවා යයි. වැදගත්වන්නේ අප දක්වන සැලකිල්ලය.

"මගේ අපේක්ෂාව වන්නේ, දුරකථන ඇමතුමක් හෝ ත්‍රෛයිමාසික හෝ මාසික බැහැදකීම් ගැන කරදරවීම නවත්වන ලෙස සොහොයුරියන්ගෙන් ඉල්ලා සිටීමය" මේරි එලන් ස්මූට්, සහන සමිතියේ 13වෙනි ප්‍රධාන සභාපතිනිය "මෘදු ප්‍රාණ පෝෂණයකිරීම වෙනුවට සිත යොමුකිරීමට"[4] ඇය අපගෙන් ඉල්ලා ඇත.

ස්පෙන්සර් ඩබ්ලිව් කිම්බල් සභාපතිතුමා, (1895–1985) මෙසේ ඉගැන්වීය, "රාජධානියේ අප එකිනෙකාට සේවයකිරීම අත්‍යාවශ්‍යවේ." එහෙත් සෑම සේවයක්ම වීරකකමක් වීම අවශ්‍ය නොවන බව ඔහුගේ පිළිගැනීමය. "නිතරම මෙන්, අපගේ සේවා ක්‍රියා සමන්විතවන්නේ සරළ දිරිගැන්වීම්, හෝ දීමනාය … ලෞකික වැඩවලදී උපකාරකිරීමය," ඔහු මෙසේද කීය, "නමුත් කුඩා නමුත් ඕනෑකමින් කරන ක්‍රියාවලින් … කෙතරම් ශ්‍රේෂ්ඨ ප්‍රතිඵල ඇතිවන්නේද!"[5]

**සටහන්**

1. තෝමස් එස්. මොන්සන්, "What Have I Done for Someone Today?" *Liahona,* නොවැ. 2009, 85.
2. )බලන්න *අත්පොත 2: Administering the Church* (2010), 9.5.1.
3 බලන්න *අත්පොත 2,* 9.5.4.
4. මේරි එලන් ස්මූට්, *Daughters in My Kingdom* තුලිනි: *The History and Work of Relief Society* (2011), 117.
5. *Teachings of Presidents of the Church: Spencer W. Kimball* (2006), 82.

### *මට කුමක් කළ හැකිද?*

**1.** රැකබලාගැනීමට මට පවරා තිබෙන එක් එක් සොහොයුරියගේ ආත්මික සහ ලෞකික අවශ්‍යතාවයන්වලට ප්‍රතිචාර දක්වන්නේ කෙසේදැයි දැනගැනීමට මා දේව අනුග්‍රහය සොයන්නේද?

**2.** මා රැක බලාගන්නා සොහොයුරියන් සහ ඔවුන්ගේ පවුල් ගැන මා සැලකිලිමත් බව ඔවුන් දැනගන්නේ කෙසේද?

වැඩිදුර තොරතුරු සඳහා යන්න, reliefsociety.lds.org.

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/11. පරිවර්තන අනුමැතිය: 6/11. *Visiting Teaching Message, September 2012* පරිවර්තනයයි. Sinhala. 10369 408